
# මායා යෂ්ටිය



තරුලි රුහන්සා සමරතුංග ආරච්චි

# මායා යෂ්ටිය


## තරුලි රුහන්සා සමරතුංග ආරච්චි


**(කතා)**

**දෙවන දිගහැරුම**


**මහ/ මහමායා බාලිකා විදුහල**

**මහනුවර**

**3 ශ්‍රේණිය E**


**2026.05.10**


**ISBN : 978-624-211-017-2**

# පිදුම

කුඩා කල සිට

සෙනෙහසින් මා හැදූ වැඩූ

අම්මාට අප්පච්චිට අක්කාට

මෙවන් අවස්ථාවක් උදා කර දුන්

මාගේ විදුහල් මෑණියටන්ට

මගේ මේ දෙවන වෑයම

උපහාරයක්ම

වේවා!

# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුළු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලි චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දෑල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

ඔන්න එකෝමත් එක රටක හිටියා පුංචි ගැහැණු ළමයෙක්. ඇයගේ නම දිනිතිය. ඇය ජීවත් වුණේ අම්මා, තාත්තා සහ නංගි සමඟයි. ඔවුන් හරිම දුප්පත් පවුලක් වේ.



එක දවසක් අක්කයි නංගියි මිදුලේ සෙල්ලම් කරමින් සිටියා. දිනිතිටයි, නංගිටයි සෙල්ලම් කරන්න සෙල්ලම් බඩු තිබුනේ නැහැ. ඒ නිසා ඔවුන් පොල් කටු ඇරගෙන කෝම්පිට්ටු හැදුවා.



අක්කයි නංගියි සතුටින් සෙල්ලම් කලා. එක පාරටම එළිය විහිදුවමින් සුරංගනාවියක් මතු වුණා.



දිනිතියි ඇයගේ නංගි වන පිනිදි එක පාරටම පුදුම වුණා.

"ඔයාලාට මොනවාද ඕනෑ"

සුරංගනාවිය ඇසුවා.

"අපි ආසයි හොඳින් ඉගෙන ගන්න".

ඔවුන් පැවසුවා.

"ඔයාලාට මේ මායා යෂ්ටියෙන් ඕන දෙයක් ලබා ගන්න පුළුවන්".

සුරංගනාවිය පැවසුවා.



ඔවුන් පුදුමයෙන් එදෙස බැලුවා. මායා යෂ්ටිය අතට ගත් නංගි සුරංගනාවියට ස්තුති කළා. සුරංගනාවිය එකපාරටම නොපෙනී ගියා.



ඔවුන් ඉක්මණින් මායා යෂ්ටිය අතට ගෙන අම්මා ළගට දිව ගියා. අම්මා ඇහුවා,

"ඔයාලාට මේ මායා යෂ්ටිය කොහෙන්ද ලැබුණේ "

“අපි මිදුලේ සෙල්ලම් කරන විට එක පාරටම එළිය විහිදුවමින් සුරංගනාවියක් මතු වී මායා යෂ්ටිය අතට දුන්නා”. අක්කා කියන විට අම්මාත් එක පාරටම පුදුම වුණා.



අම්මා කඩේට ගියා. ඒ දෙන්නා අම්මා එන තුරු මග බලා සිටියා. එවිට ඔවුන් දැක්කා, ලේන් පැටවෙක් ගසකින් බිමට වැටිලා සිටිනවා. ඔවුන් දෙදෙනා ඉක්මණින් දිව ගොස් ලේන් පැටවා අතට ගත්තා.



අක්කා ඉක්මණින් දිව ගොස් වතුර සහ පලතුරු ගෙනැවිත් දුන්නා.

ඔවුන් ලේන් පැටියාව ගස උඩින් තිබ්බා. එක් පාරටම එළිය විහිදුවමින් සුරංගනාවිය එතැනට මතු වුණා.

"මම දැක්කා පුංචි ඔයාලා කරපු හොද වැඩේ, ඔයාලා හරිම හොඳ ළමයි".

සුරංගනාවිය කිව්වා.

ඇය එක්වරම නොපෙනී ගියා.

එක් දිනයක් දිනිතිට බෝනික්කෙක් ගේන්න කියලා පාසලේ

ගුරුතුමිය කිව්වා.

දිනිති ගෙදර ගොස් අම්මාට කිව්වා.

"අම්මේ මට හෙට ගුරුතුමි කිව්වා ලස්සනම බෝනික්කෙක්

ගේන්න කියලා".

දිනිති කිව්වා.

"අනේ පුතේ මට සල්ලි කෙහෙන්ද බෝනික්කෙක් ගන්න".

අම්මා කිව්වා.

දිනිති දුක් වුණා.



ඇයට එක් වරම මායා යෂ්ටිය මතක් වුණා. දිනිති දිවගොස් මායා යෂ්ටිය ගෙන කිව්වා මට ලස්සන බෝනික්කෙක් ලබා දෙන්න කියලා.

ඇයට ලස්සන බෝනික්කෙක් ලබා දුන්නා. ඇය මායා යෂ්ටියට ස්තුති කළා.





ඇය පසුදින බෝනික්කා සමඟ සතුටින් ඉස්කෝලේ ගියා.

ඇයට ගොඩාක් සතුටුයි. ඇය යහළුවන් සමඟ බෝනික්කෝ අරගෙන සතුටින් සෙල්ලම් කළා.

දිනිති සහ පිනිදි  හොඳින් ඉගෙන ගත්තා. ඔවුන්ට ඉගෙන ගැනීමට අවශ්‍ය බොහෝ දේ මායා යෂ්ටිය ලබා දුන්නා.

අපිත් සමාජයේ යහපත් ගුණධර්ම ඇති ළමයින් වෙමු.

නිමි.....



# පසුවදන

අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.
මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)

**ISBN : 978-624-211-017-2**